# රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
# பதிவாளர் நாயகம் திணைக்களம்
# REGISTRAR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. RG/AB/24 /වා.ස්.මා./2024

ප්‍රධාන කාර්යාලය / தலைமை அலுவலகம் / HEAD OFFICE

234 / A3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
234/A3, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்லை.
234/A3, Denzil Kobbakaduwa Mawatha, Battaramulla.

තැ. පෙ. අංකය / த. பெ. இல. / P. O. Box No. 565

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2024.12.04


අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්,

ප්‍රාදේශීය ලේකම්වරුන්,

ප්‍රධාන කාර්යාලයේ සියළුම අංශ භාර මාණ්ඩලික නිලධාරීන්,

කලාප භාර නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන්,

මධ්‍යම ලේඛනාගාරය භාර නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල්,

දිස්ත්‍රික් භාර සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන්,

සියළුම ඉඩම් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් වෙත.

<u>ඒකාබද්ධ සේවාවන්හි නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු - 2025</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක COM/TRANS/V/වා.ස්.මා./2025 හා 2024.11.22 දිනැති ලිපිය හා මාගේ සමාංක හා 2024.10.22 දිනැති ලිපිය හා බැඳේ.

02. එම ලිපියට අදාලව ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය, කළමනාකරණ සේවා නිලධාරි සේවය, සංවර්ධන නිලධාරි සේවය, ඒකාබද්ධ රියදුරු සේවය හා කාර්යාල සේවක සේවය යන තනතුරු සඳහා අදාල සමාලෝචන කමිටු තීරණ වාර්තා සඳහා http://www.pubad.gov.lk නිල වෙබ් අඩවියෙහි ස්ථාන මාරුවීම් නිවේදන වෙත යොමුවන මෙන් දන්වමි. එමෙන්ම ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක COM/TRANS/V/වා.ස්.මා./2025 හා 2024.11.22 දිනැති ලිපියට අනුව ස්ථාන මාරු තීරණ මේ සමඟ අමුණා ඇති ඇමුණුම මඟින් ඉදිරිපත් කරමි.

04. 2025 වර්ෂය සඳහා වූ ස්ථාන මාරු නියෝග සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරනු ලැබිය හැකි වෙනස්කම් වලට යටත්ව, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන දින සිට හෝ අදාළ ස්ථාන මාරු නියෝගවලට ඉදිරියෙන් දක්වා ඇති දින සිට ස්ථානමාරු ක්‍රියාත්මක වේ. තවද, අදාළ නිලධාරියාගේ නම ඉදිරියෙන් ස්ථානමාරුව ක්‍රියාත්මක වන දිනය සටහන් කර නොමැති 2025 වාර්ෂික ස්ථාන මාරු 2025.01.01 දින සිට හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන දින සිට ක්‍රියාත්මක වේ.

05. ඒ අනුව, ඔබ කාර්යාලයේ / අංශයේ සේවය කරන, ස්ථාන මාරුවීම් ලබා ඇති නිලධාරීන්, <u>අනුප්‍රාප්තිකයන් පැමිණෙන තෙක් රඳවා නොගෙන</u> නියමිත දින නව සේවා ස්ථානයේ රාජකාරි භාර ගැනීමට හැකිවන සේ මුදාහැරීමට කටයුතු කරන ලෙස දන්වමි.


දුරකථන අංකය / தொலைபேசி இல. / Telephone No. 2889488 2889489

ෆැක්ස් අංකය / தொலைநகல் / Fax No. 2889491

වෙබ් අඩවිය / இணையத்தளம் / Website www.rgd.gov.lk

විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் / E-mail rgd@sltnet.lk rg@rgd.gov.lk

06. වාර්ෂික ස්ථාන මාරු නියෝගයක් මත නියමිත පරිදි ස්ථාන මාරු නියෝග ලබා ඇති නිලධාරියෙකු නව සේවා ස්ථානය වෙත රාජකාරි සඳහා වාර්තා නොකර සිටින අවස්ථාවක දී එම නිලධරයා ස්ථාන මාරුව ලබා ඇති කාර්යාලයේ ආයතන ප්‍රධානියා විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 01 වැනි කාණ්ඩයේ xviii වන පරිච්ඡේදයේ 257 වන වගන්තිය හා xv වන පරිච්ඡේදය අනුව සේවය හැර යාමේ නිවේදනය නිකුත් කිරීමට කටයුතු කළ යුතු බවට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කර ඇති බැවින් ඒ අනුව ඉදිරි කටයුතු සිදුකර ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත දැන්විය යුතුය.

07. 2025 වාර්ෂික ස්ථාන මාරු නියෝග අනුව නව සේවා ස්ථානයට වාර්තා කරන නිලධරයන් ද, මුදාහළ නිලධරයන් ද, පිළිබඳව මේ සමඟ වන ඒ.සේ ./ වා.ස්.මා /07, සහ ඒ.සේ./ වා.ස්.මා./ 08 ආකෘති මඟින් ස්ථාන මාරු ක්‍රියාත්මක වන දින සිට මාස 02 ක් ඇතුළත ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත වාර්තා කළ යුතුය. ඒ සමඟ අදාළ නිලධරයන් සේවයට වාර්තා කළ බවට හා මුදාහළ බවට වන ලිපිවල පිටපත් ද ඉදිරිපත් කළ යුතුය. (ඒ.සේ/වා.ස්.මා/05, හා ඒ.සේ/වා.ස්.මා/06)

08. 2025 වාර්ෂික ස්ථාන මාරුවීම් යටතේ ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් ලබා දී ඇති ස්ථාන මාරු නියෝග වලට අමතරව අමාත්‍යාංශ හෝ දෙපාර්තමේන්තු අභ්‍යන්තර ස්ථාන මාරු නියෝග යටතේ කිසියම් නිලධාරියෙකුට ස්ථාන මාරුවීමක් ලැබී තිබුනේ වුවද මෙම සමාලෝචන කමිටු තීරණවලින් වූ සංශෝධන වලට යටත්ව 2024.10.18 දිනැති වාර්ෂික ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක විය යුතු බව සැලකිම මැනවි.

09. තවද, 2025 වාර්ෂික ස්ථාන මාරු තීරණ ක්‍රියාත්මක කිරීමේදී අමාත්‍යාංශ වෙනස් වීම හේතුවෙන් යම් නිලධාරියෙක් ස්ථාන මාරු විය යුතු සේවා ස්ථානය පිළිබඳ ගැටළුවක් පවතී නම්, එවැනි අවස්ථාවලදී අනුප්‍රාප්තිකයා වශයෙන් සලකනු ලබන නිලධාරියාගේ වර්තමාන සේවා ස්ථානය, අදාළ නිලධාරියාගේ නව සේවා ස්ථානය විය යුතු බව දන්වමි. **ප්‍රාදේශීය කාර්යාල වලට ස්ථාන මාරු ලබාදී ඇති නිලධාරීන් ප්‍රධාන කාර්යාලය වෙත වාර්තා කිරීමෙන් අනතුරුව අදාල ප්‍රාදේශීය කාර්යාලයට යොමු කරනු ලැබේ.**

10. එමෙන්ම ඔබ ආයතනයේ ඒකාබද්ධ සේවයේ නිලධාරීන් වෙත ලබා දී ඇති මෙතෙක් ක්‍රියාත්මක නොවූ, 2025 වාර්ෂික ස්ථාන මාරුවලට ඇතුළත් නොවන 2024 වාර්ෂික ස්ථාන මාරු නියෝග ද නොපමාව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගන්නා මෙන් කාරුණිකව දන්වා සිටිමි.

පී.ඩබ්.එස්.එච්.සරත්චන්ද්‍ර
නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල් (පාලන)
රෙජිස්ට්‍රාර් ජනරාල් වෙනුවට
දුරකථන අංකය - 0112072016
ෆැක්ස් අංකය - 0112889493
විද්‍යුත් ලිපිනය - drg@rgd.gov.lk